සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development

මගේ අංකය / எனது இல / My No: DSD/HO/05/MF/02/07/අතරුදි
ඔබේ අංකය / உமது இல / Your No: ....
දිනය / திகதி / Date: 2021.11.23

2021.11.12 දිනැති 2021/93/01 අංක සහිත අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවෙන් අනුමැතිය ලබා ඇත.

සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ - 2021/19

විධායක කමිටු /පාලක මණ්ඩල සභාපතිවරුන්,
සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති කළමණාකරුවන් ,
සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමණාකරුවන් වෙත.

<u>සමෘද්ධි ප්‍රජාමූල බැංකු, සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති, ක්ෂේත්‍රයේ රාජකාරී කරන සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සඳහා අතරුදි මුදල් රක්ෂණ වැඩසටහන හා බැංකු කාර්ය මණ්ඩලය සඳහා ශාරීරික අනතුරු රක්ෂණ වැඩසටහන සහ මුදල් සේප්පු සඳහා රක්ෂණ ආවරණ ලබාදීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.</u>

හැඳින්වීම.

මෙතෙක් සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා ප්‍රජාමූල බැංකු සමිති වෙනුවෙන් ක්‍රියත්මක වූ අතරුදි මුදල් හා ශාරීරික අනතුරු රක්ෂණ වැඩසටහන, සමෘද්ධි වැඩසටහනේ කාලීන අවශ්‍යතා අනුව තව දුරටත් පුළුල්ව හා ඵලදායී ලෙස පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය වී ඇත. සමෘද්ධි බැංකු ක්‍රියාදාමය ඔස්සේ රැස් වන ප්‍රජාවගේ මුදලට හා නිලධාරීන්ගේ ජීවිත වෙනුවෙන් වැඩි ආරක්ෂිත භාවයක් ලබාදීමේ අරමුණින් අතරුදි මුදල් හා ශාරීරික අනතුරු රක්ෂණ වැඩසටහනට නව ක්ෂේත්‍ර කිහිපයක් ඇතුළත් කිරීමට මෙම නව චක්‍රලේඛය නිතුත් කෙරේ.

මෙම චක්‍රලේඛය නිකුත් කිරීමත් සමගම දි/ප්‍ර/බැ 2015/02 අංක සහිතව 2015.08.06 දිනැතිව නිකුත් කර තිබූ "දිවිනැගුම ප්‍රජාමූල බැංකු/ ප්‍රජාමූල බැංකු සමිති සඳහා අතරුදි මුදල් රක්ෂණ වැඩසටහන හා දිවිනැගුම ප්‍රජාමූල බැංකු කාර්ය මණ්ඩලය සඳහා ශාරීරික අනතුරු රක්ෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම" නම් චක්‍රලේඛය අවලංගු වේ.

01. අතරුදි මුදල් රක්ෂණ වැඩසටහන.

1.1 සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති අතරුදි මුදල් රක්ෂණය.

1.1.2 එක් දිනක් තුළ සමෘද්ධි ප්‍රජාමූල බැංකු හෝ බැංකු සමිති සතු මුදල් සේප්පුවේ තැන්පත් කර ඇති මුදල, මුදල් අයකැමි භාරයේ පවතින මුදල, වාණිජ බැංකු වෙත ගෙන යන හා වානිජ බැංකු වෙතින් ගෙන එන මුදල් සියල්ලේ එකතුව ප්‍රජාමූල බැංකු හෝ බැංකු සමිතිවල අතරුදි මුදල් රක්ෂණ සීමාව ලෙස හැඳින් වේ.

1.2 ක්ෂේත්‍රයේ කටයුතු කරන සංවර්ධන නිලධාරීන්ගේ අතරුදි මුදල් රක්ෂණය.

1.2.1 2022 වසරේ සිට ග්‍රාම නිළධාරී වසම්වල රාජකාරී කරනු ලබන සමෘද්ධි සංවර්ධන නිලධාරීන් එම ක්ෂේත්‍රයේ රැස් කරනු ලබන මුදල් සඳහා ද අතරුදි මුදල් රක්ෂණ ආවරණය ලබාදේ. චක්‍රලේඛ මගින් ලබා දී ඇති උපදෙස් අනුව ක්ෂේත්‍ර ලැබීම් ලෙස සමෘද්ධි බැංකු ගණුදෙනුකරුවන් වෙතින් රැස් කළ මුදල ක්ෂේත්‍රයේ කටයුතු කරන සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ අතරුදි මුදල් රක්ෂණය ලෙස හඳුන්වයි.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

	අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General	අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி (நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment)	ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant	අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி) / Director (Micro Finance)	කාර්යාලය / அலுவலகம் / Office
Tel-	011-2872202	011-2873799	011-2869742	011-2889003	0112872202
Fax -	011-2889002	011-2873996	011-2869742	011-2887469	
E-mail-	dg@samurdhi.gov.lk	diradmin@samurdhi.gov.lk	finance@samurdhi.gov.lk		
		Hot Line :0112-889007		Hot Line:0112-885582	Hot Line: 011- 2887722

1.2.2. මෙහිදී, සමෘද්ධි සංවර්ධන නිළධාරීන් ක්ෂේත්‍ර ලැබීම් ලෙස රැස් කළ මුදල් ප්‍රජාමූල බැංකුව වෙත භාරදීමට නියමිත දිනය දක්වා, භාරදීමට නියමිතව ඇති මුදල අතරැදි මුදල් රක්ෂණයට ඇතුළත් වේ. මෙම අවස්ථාවේ රු.100,000/- ක් වන උපරිම මුදලකට රක්ෂණ ආවරණය ලබා දේ.

1.3 සෑම සමෘද්ධි ප්‍රජාමූල බැංකුවක් ම / බැංකු සමිතියක් ම වාර්ෂිකව අතරැදි මුදල් රක්ෂණ ආවරණය ලබා ගත යුතුය.

1.4 සමෘද්ධි ප්‍රජාමූල බැංකුවේ අතරැදි මුදල් රක්ෂණ ආවරණයට එම බැංකුවට අනුයුක්ත ක්ෂේත්‍රයේ කටයුතු කරන සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ අතරැදි මුදල් ද ඇතුළත් වේ.

02. සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා ප්‍රජාමූල බැංකු සමිතිවල අතරැදි මුදල් රක්ෂණ සීමාව තීරණය කිරීම.

2.1 වසරකට රුපියල් මිලියන 02 ක් ව පැවැති රක්ෂණ ආවරණ උපරිම මුදල් සීමාව 2022 වසරේ සිට රුපියල් මිලියන 05 දක්වා වැඩි කෙරේ. රක්ෂණ ආවරණ මුදල් සීමාවන් හා ඒ වෙනුවෙන් ගෙවිය යුතු රක්ෂණ වාරික මුදල් පිළිබඳ ඇමුණුම 01 හි සඳහන් කර ඇත.

2.2 සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති අතරැදි මුදල් රක්ෂණ සීමාව තීරණය කිරීමේ දී තම ප්‍රජාමූල බැංකුව/ ප්‍රජාමූල බැංකු සමිතිය තුළ සිදු කෙරෙන ගණුදෙනු ප්‍රමාණය පිළිබඳ අවධානය යොමු කළ යුතු ය. දෛනික ගණු දෙනු ප්‍රමාණය, තම ගිණුම පවත්වාගෙන යන වානිජ බැංකුව වෙතින් ගෙන එන සහ ගෙන යන මුදල් ප්‍රමාණය, සහ තම ක්ෂේත්‍ර බල ප්‍රදේශයට අයත් ග්‍රාම නිළධාරී වසම් ප්‍රමාණය යනාදිය ද සැලකිල්ලට ගෙන පාලක මණ්ඩලය/ විධායක කමිටුව හා සාකච්ඡා කර රක්ෂණ මුදල් සීමාව තීරණය කර ගත යුතු ය.

2.3 අනවශ්‍ය අයුරින් විශාල මුදල් ප්‍රමාණයක් රඳවා ගැනීම කිසිසේත් ම නො කළ යුතු ය. වැඩි ගණුදෙනු ප්‍රමාණයක් සිදු කරන ඉහළ ණය නිකුතුවක් පවතින සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති පමණක් අවශ්‍යතාවය පරිදි ඉහළ මුදල් සීමාවක් තබා ගැනීම කළ යුතු ය.

2.4 වැඩි ගණු දෙනු ප්‍රමාණයක් සිදු කරන හා ඉහළ ණය නිකුතුවක් පවතින ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති වැඩි මුදල් ප්‍රමාණයක් සඳහා රක්ෂණ ආවරණය ලබා ගත්ත ද දෛනික අවශ්‍යතා සැලකිල්ලට ගෙන අවම මුදලක් අතරැදි මුදල් සීමාව තුළ තබා ගැනීමට වග බලා ගත යුතු ය.

03. අතරැදි මුදල් රක්ෂණය සඳහා 5% සහනයක් ලබාදීම.

3.1 අතරැදි මුදල් රක්ෂණ ආවරණය ලබාගැනීමේ දී 2022 වසරේ සිට රු. 15,000/- සිට රු.ලක්ෂ 25 දක්වා මුදල් සීමාවට (රු.ලක්ෂ 25 ද ඇතුළත්ව) 5% සහනය හිමි වේ.

3.2 සමෘද්ධි ප්‍රජාමූල බැංකුවක්, සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතියක් පළමු වරට රක්ෂණ ආවරණය ලබාගන්නා විට කවර මුදල් සීමාවක සිටිය ද නියමිත සම්පූර්ණ වාරික මුදල ම එවිය යුතු ය.

3.3 අතරැදි මුදල් රක්ෂණය යටතේ, පෙර වසරේ රක්ෂණ වන්දි ලබා ගෙන නො මැති නම් සහනය ලබාදෙන මුදල් සීමාව තුළ සිටී නම් අදාල වසරේ නියමිත වාරික මුදලින් 5% ක ප්‍රමාණය අඩු කළ හැකි ය. ඊළග වසරේදීත් වන්දි ලබාගෙන නො මැති නම් මුදල් ප්‍රමාණය වෙනස් නො වේ නම් රක්ෂණ වාරික මුදල සමාන වේ. (5% ක සහන මුදල අඩු කළ පසු)

3.4 වන්දි ලබා නො ගෙන, ඊළඟ වසරේ 5% ක සහනය ලබාදෙන මුදල් සීමාවන් තුළ ම රක්ෂණ ආවරණ මුදල වැඩි කරන්නේ නම් පෙර සිටි වාරික මුදලට හිමි වන 5% ක සහන මුදලේ වටිනාකම වැඩිකරන මුදලේ සම්පූර්ණ වාරිකයෙන් අඩු කළ යුතු ය.

3.5 අතරැදි මුදල් සඳහා පෙර වසරේ රක්ෂණ වන්දි ලබා ගත හොත්, ඊළඟ වසරේ සහන ලබාදෙන මුදල් සීමාව තුළ සිටිය ද, 5% ක සහනය හිමි නොවන අතර වාරිකයට නියමිත සම්පූර්ණ මුදල ම එවිය යුතු ය. එළඹෙන වසරේ එම මුදල් සීමාවන් තුළ සිටීනම් නැවත 5% සහනය ලබාගත හැකි ය.

3.6 5% සහනය ගණනය කිරීමට උදාහරණ.

2022 වසරේ පළමු වරට (ආරම්භක අවස්ථාවේ දී) රු.ලක්ෂ 5 ක් සඳහා රක්ෂණ ආවරණය ලබාගන්නා බැංකුවක් / බැංකු සමිතියක් එවිය යුතු වාරික මුදල - රු. 12,000.00

වන්දි ලබා නො ගත්තේ නම් 2023 වසරට එම බැංකුව
රු.ලක්ෂ 5 ක් සඳහා එවිය යුතු මුදල (5% සහනය අඩු කළ පසු - රු. 11,400.00

- $\frac{\text{රු. } 12,000 \times 5}{\text{රු. } 100}$ = රු. 600.00
- රු. 12,000 - රු. 600
- රු. 11,400.00

2024 වසරේ එම බැංකුව රු. ලක්ෂ 5 සීමාව තුළ සිටී නම් එවිය යුතු මුදල - රු. 11,400.00
2025 වසරේ එම බැංකුව රු. ලක්ෂ 10 දක්වා වැඩි කරයි නම් ඒසඳහා
එවිය යුතු වාරික මුදල - රු. 21,400.00

රු. ලක්ෂ 10 ට නියමිත වාරික මුදල - රු. 22,000.00
අඩුකළා රු. ලක්ෂ 05 ට නියමිත 5% සහන මුදල - රු. 600.00
- රු. 21,400.00

2026 වසර සඳහා රු.ලක්ෂ 10 මුදලකට රක්ෂණ ආවරණය ලබාගන්නේ නම්
එවිය යුතු වාරික මුදල - රු. 20,900.00
රු.ලක්ෂ 10 ට නියමිත මුදල - රු. 22,000.00

- $\frac{\text{රු.} 22,000 \times 5}{\text{රු. } 100}$
- රු. 1,100.00
- රු. 22,000 - රු. 1,100
- රු. 20,900.00

04. වසර අවසන් වීමට පෙර අතරැදි මුදල් රක්ෂණ සීමාව වැඩි කර ගැනීම.

4.1 යම් ප්‍රජාමූල බංකුවකට හෝ ප්‍රජාමූල බැංකු සමිතියකට අවශ්‍යතාව මත වසර අවසන් වීමට පෙර රක්ෂණ මුදල් සීමාව වැඩි කර ගත හැකි ය. පාලක මණ්ඩලය / විධායක කමිටුව සමග සාකච්ඡා කර මුදල් සීමාව තීරණය කර ගැනීමෙන් අනතුරුව ඒ සඳහා වාරික මුදල් එවා රක්ෂණ මුදල් සීමාව ඉහළ නංවා ගත හැකි ය. ඒ සඳහා ප්‍රජාමූල බැංකු අංශයට ඉල්ලීම් ඉදිරිපත් කර, එය පිළිගත් බවට දැනුම් දීමෙන් පසු වැඩිකළ මුදල් සීමාව බැංකුව තුළ රඳවා ගත හැකි ය.

4.2 වසර මැද මුදල් සීමාව වැඩි කර ගන්නා විට, වැඩි කරන මුදල් සීමාවට නියමිත වාරික මුදලින් ඒ වන විට එවා ඇති වාරික මුදල අඩු කළ යුතු ය. ලැබෙන පිළිතුර 12 න් බෙදිය යුතු ය. (මසකට ගෙවිය යුතු මුදල සොයා ගැනීම සඳහා) අනතුරුව එම අගය වසරේ ඉතිරි මාස ගණනින් වැඩි කළ යුතු ය. ලැබෙන අගය රක්ෂණ වාරිකය සඳහා එවිය යුතු මුදල වේ.

4.3 **වසර මැද මුදල් සීමාව වැඩි කළ විට වාරික මුදල ගණනය කිරීමට උදාහරණ.**

2022 වසරේ රු.ලක්ෂ 5 ක් සඳහා එවා ඇති වාරික මුදල	- රු.11,400.00
2022 අප්‍රේල් 1 දින සිට රු. ලක්ෂ 10 දක්වා වාරික මුදල වැඩි කරන්නේ නම් එවිය යුතු මුදල	- රු. 7949.99
ආසන්න අගයට ගත් විට	- රු. **7950.00**
ලක්ෂ 10 නියමිත වාරික මුදල	- රු. 22000.00
එවා ඇති මුදල	- රු. 11,400.00
	- රු. 22,000-රු.11,400= රු.10,600.00
	10,600.00/12 = රු. 883.33
	- රු. 883.33 X 9
තවදුරටත් එවිය යුතු වාරික මුදල	- රු. 7949.99
	- රු. **7950.00**

4.4 මෙම වර්ෂයේ දී වන්දි ලබා නොගත්තේ නම් ඊළඟ වසරේ සිට රු.ලක්ෂ 10 ට නියමිත වාරික මුදල එවීමේ දී 5%ක සහනය සම්පූර්ණයෙන් ලබා ගත හැකි ය. යම් වර්ෂයක් සඳහා රක්ෂණ හිමිකම ලබාගත් පසු බැංකුවකට හෝ බැංකු සමිතියකට රක්ෂණ මුදල් සීමාව අඩු කර එවා ඇති දායක මුදල් ආපසු ඉල්ලා සිටිය නොහැකි ය.

05. මුදල් සේප්පුව සඳහා රක්ෂණ ආවරණය ලබාදීම. (සේප්පු රක්ෂණය)

5.1 2022 වසරේ සිට සමෘද්ධි ප්‍රජාමූල බංකු හා සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති සතු මුදල් සේප්පුව සඳහා ද විශේෂිත රක්ෂණ ආවරණයක් හඳුන්වා දේ.

5.2 මුදල් සොරා ගැනීමක් හෝ පැහැර ගැනීමක් සිදුවන අවස්ථාවක මුදල් සේප්පුව සම්පූර්ණයෙන් විනාශ වුවහොත් හෝ හානියක් සිදුවුවහොත් එම විනාශය හෝ හානිය තක්සේරු කර රක්ෂණ වන්දි ලබාදීම මේ මගින් සිදු කෙරේ.

5.3 මුදල් සේප්පුව සඳහා රක්ෂණ ආවරණය ලබාගැනිමට ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති වසරකට රු.1000/- ක රක්ෂණ වාරික මුදලක් එවිය යුතු ය.

06. ශාරීරික අනතුරු රක්ෂණ වැඩසටහන

6.1 සමෘද්ධි ප්‍රජාමූල බැංකුවේ රාජකාරී කරන කළමනාකරු ඇතුළු කාර්ය මණ්ඩලයට ශාරීරික අනතුරු රක්ෂණ ආවරණය ලබා දේ. ප්‍රජාමූල බැංකු සතු මුදල් සොරා ගැනීමක් පැහැර ගැනීමක් සිදුවන අවස්ථාවක හෝ මුදල් වානිජ බැංකු වෙත ගෙන යන/ ගෙන එන අවස්ථාවක මුදල් පැහැර ගැනීමක දී නිලධාරීන්ට සිදුවන ජීවිත හානි හෝ ශාරීරික අනතුරු හෝ වෙනුවෙන් මෙම රක්ෂණ ආවරණය ලබාදෙයි.

6.2 ඉහත ඡේද අංක 6.1 හි සඳහන් සිදුවීමක් වන අවස්ථාවක, එම බැංකු පරිශ්‍රයේ රාජකාරී කටයුතු වෙනුවෙන් පැමිණ සිටි සමෘද්ධි බැංකු සමිති/ මූලස්ථාන/ ක්ෂේත්‍ර ඇතුළු සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් ඕනෑම නිලධාරියකුට සිදුවන ජීවිත හානි හෝ ශාරීරික අනතුරු වෙනුවෙන් ද මෙම රක්ෂණ ආවරණය හිමි වේ.

07. ශාරීරික අනතුරු රක්ෂණ වාරික මුදල් එවීම.

7.1 සෑම සමෘද්ධි ප්‍රජාමූල බැංකුවක්ම වාර්ෂිකව මෙම රක්ෂණ ආවරණය ලබා ගත යුතුය.

7.2 ප්‍රජාමූල බැංකු තම කාර්ය මණ්ඩලය වෙනුවෙන් වසරකට රු.1000/- ක මුදලක් ශාරීරික අනතුරු රක්ෂණ වාරික ලෙස එවිය යුතු ය.

7.3 2021/12 චක්‍රලේඛය අනුව නැවත දන්වන තුරු සමෘද්ධි බැංකු හා බැංකු සමිති කොවිඩ් හා හදිසි අනතුරු රක්ෂණය සඳහා අදාළ වාරික මුදල් එවිය යුතුය.

08. අතුරුදී මුදල්, ශාරීරික අනතුරු හා සේප්පු රක්ෂණය වෙනුවෙන් චෙක්පත ලිවීම.

8.1 සමෘද්ධි ප්‍රජාමූල බැංකු 2022 වසරේ සිට අතුරුදී මුදල් රක්ෂණය, ශාරීරික අනතුරු රක්ෂණය, කොවිඩ් හදිසි අනතුරු රක්ෂණය, මුදල් සේප්පු රක්ෂණය යන සියල්ලේ එකතුවට සමාන වටිනාකමට එක චෙක්පතක් ප්‍රජාමූල බැංකු අංශයට එවිය යුතු ය.

8.2 ප්‍රජාමූල බැංකු සමිති ද අතුරුදී මුදල් රක්ෂණය, මුදල් සේප්පු රක්ෂණය, කොවිඩ් හදිසි අනතුරු රක්ෂණය වෙනුවෙන් රක්ෂණ වාරික මුදල් එක් චෙක්පතකින් එවිය යුතුය.

8.3 එම චෙක්පත "කළමනාකරු, ලංකා බැංකුව, සමෘද්ධි ප්‍රජාමූල බැංකු අතුරුදී මුදල් රක්ෂණ අරමුදල් ගිණුම ගිණුම් අංක 2937825" ලෙස ලිවිය යුතු ය.

8.4 චෙක්පත මෙයට පරිබාහිර ආකාරයකින් ලිවීම නො කළ යුතු ය. එසේ ම දිනය, චෙක්පතේ වටිනාකම ඉලක්කමෙන් හා මුදලෙන් ලිවීම, අණකරු අත්සන් යෙදීම, නිල මුද්‍රාවන් තැබීම නිවැරදිව කළ යුතු ය.

8.5 චෙක්පත සමග සම්පූර්ණ කරන ලද ඇමුණුම 02 ආකෘතිය ද අමුණා එවිය යුතු ය. එම ආකෘතිය නිවැරදිව සම්පූර්ණ කළ යුතු ය.

8.6 සෑම වසරක ම දෙසැම්බර් මස 15 දිනට පෙර රක්ෂණ වාරික සඳහා වූ එම චෙක්පත හා ඇමුණුම 02 ආකෘතිය "අධ්‍යක්ෂ ක්ෂුද්‍ර මූල්‍ය, ප්‍රජාමූල බැංකු අංශය, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව, සෙත්සිරිපාය, බත්තරමුල්ල" ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

8.7 දෙසැම්බර් 15 දිනට පසු එවන චෙක්පත් සඳහා 10% ක අධි භාරයක් අය කරනු ලැබේ. එම දඩ මුදල බැංකු/ බැංකු සමිති කළමනාකරු හා අදාල කාර්ය මණ්ඩල පෞද්ගලික මුදලින් ගෙවිය යුතු ය. එසේම අඩු පාඩු සහිත චෙක්පත් එවීම හේතුවෙන් චෙක්පත අගරු වන අවස්ථාවලදී ද 10% ක අධි භාරයක් අය කරනු ලැබේ. එම දඩ මුදල ද කාර්ය මණ්ඩලයේ පෞද්ගලික මුදලින් ගෙවිය යුතු වේ. මෙම අධි භාරය සියළුම නිළධාරීන් සම සමව පුද්ගලිකව දරා ගත යුතුයි.

8.8 අධි භාරයක් ගෙවනු ලබන අවස්ථාවේ දී, චෙක්පතේ වටිනාකමට අධි භාරය ද එකතු කර චෙක්පත ලිවිය යුතු ය.

8.9 අතුරුදී මුදල් හා ශාරීරික අනතුරු රක්ෂණය සඳහා චෙක්පත් මගින් පමණක් මුදල් එවිය යුතු ය. කිසිදු අවස්ථාවක ගිණුමට මුදල් තැන්පත් කිරීම හෝ සෘජු ප්‍රේෂණ ලෙස වාරික මුදල් එවීම නො කළ යුතු ය.

09. වන්දි ඉල්ලුම් කිරීම.

9.1 **අතුරුදී මුදල් රක්ෂණ වැඩසටහන.**

9.1.1 යම් ප්‍රජාමූල බැංකුවක්, ප්‍රජාමූල බැංකු සමිතියක් සතු මුදල් හෝ/ සහ ක්ෂේත්‍රයේ කටයුතු කරන සමෘද්ධි සංවර්ධන නිලධාරියෙක් භාරයේ පැවති මුදල් සොරාගැනීමක්, පැහැර ගැනීමක් සිදුවුවහොත් වහාම පොලීසියට පැමිණිලි කළ යුතු ය.

9.1.2 සිද්ධිය පිළිබඳව ප්‍රාදේශීය ලේකම්, දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, අධ්‍යක්ෂ ක්ෂුද්‍ර මූල්‍ය ලිඛිතව දැනුවත් කිරීමට කටයුතු කළ යුතු ය.

9.1.3 සිදුවීම වී සති දෙකක් ඇතුළත වන්දි ඉල්ලුම් කළ යුතුය. වන්දි ඉල්ලීමේ අයදුම් පත්‍රය(ඇමුණුම්වල දක්වා ඇත) සමග පොලීසියට කළ පැමිණිල්ලේ සහතික කළ පිටපතක් සහ ප්‍රාදේශීය ලේකම්ගේ මූලික පරීක්ෂණ වාර්තාව මු.රෙ.104(3) යටතේ අලාභය පිළිබඳ ප්‍රාරම්භක වාර්තාව අධ්‍යක්ෂ ක්ෂුද්‍ර මූල්‍ය වෙත යොමු කළ යුතු ය.

9.1.4 සිද්ධිය වී මසක් ඉකුත් වූ පසු ලැබෙන අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. එම අවස්ථාවේ දී සිදුවූ පාඩුව අදාල නිලධාරීන්ට දරා ගැනීමට සිදුවනු ඇත.

9.2 මුදල් සේප්පු රක්ෂණය

9.2.1 සමෘද්ධි ප්‍රජාමූල බැංකුවක හෝ ප්‍රජාමූල බැංකු සමිතියක හෝ මුදල් සොරාගැනීමක්, පැහැර ගැනීමක් හෝ එවැන්නකට තැත් කිරීමක දී හෝ මුදල් සේප්පුව විනාශ වුවහොත් හෝ යම් හානියක් සිදුවුවහොත් හෝ ඒ පිළිබඳව සේප්පුව මිලදී ගත් ආයතනයට දැනුම් දී සිදුවී ඇති අලාභය තක්සේරු කර ගත යුතු ය.

9.2.2 සේප්පුව අළුත්වැඩියා කිරීමට හෝ මිලදී ගැනීමට වැය වන මුදල පිළිබඳව ද මිල ගණන් අදාල ආයතනයෙන් ලබා ගත යුතු ය. මිල ගණන් ලබාගැනීමේදී ඒ වෙනුවෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ උපදෙස් අනුගමනය කළ යුතු ය.

9.2.3 එම ලියවිලි සමග 9.1.3 ඡේදයේ සඳහන් ලියවිලි ද ප්‍රධාන කාර්යාලයට එවිය යුතුය. සිද්ධිය වී දින 30 ක් ඉකුත් වී ලැබෙන අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9.2.4 සේප්පුවේ ආරක්ෂාව සඳහා අනුගමනය කලයුතු උපදෙස් ඒ ආකාරයෙන්ම අනුගමනය කර තිබීම ද අත්‍යාවශ්‍ය වේ.

9.2.5 හදිසි කටයුත්තක් වන බැවින්, ආවරණ අනුමැතියට යටත්ව සේප්පුව අළුත්වැඩියා කිරීම හෝ මිළදීගැනීම සිදුකර අදාල බිල්පත් ඉදිරිපත් කර වන්දි මුදල් ඉල්ලුම් කළ හැකිය. බැංකුවේ හෝ බැංකු සමිතියේ නිළධාරීන්ගේ නොසැලිකිල්ල මත සිදුවූ හානියක දී ප්‍රජාමූල බැංකු අංශය විසින් වන්දි ලබාදීම පිළිබඳව තීරණය කරනු ලැබේ.

9.3 ශාරීරික අනතුරු රක්ෂණය.

9.3.1 සමෘද්ධි ප්‍රජාමූල බැංකු සතු මුදල්, සොරාගැනීමක්, පැහැරගැනීමක් හෝ එවැන්නකට තැත් කිරීමේදී හෝ රාජකාරියේ නියුක්තව සිටි නිලධාරියකුට ශාරීරිකව අනතුරක් සිදුවුවහොත් ඒ පිළිබඳ පොලීසියට පැමිණිලි කළ යුතු ය.

9.3.2 අනතුරුව ඇමුණුම 05 ආකෘතිය සම්පූර්ණ කර ඒ සමග පොලීසියට කළ පැමිණිල්ලේ පිටපතක් වෛද්‍ය වාර්තාව සමග අමුණා එවිය යුතු ය. අවශ්‍ය වන වෙනත් වාර්තා ද අමුණා එවිය යුතුය.

9.3.3 ජීවිත හානියක් සිදුවූ අවස්ථාවක මරණ සහතිකය ඉදිරිපත් කළ යුතු ය. එවන් අවස්ථාවක අදාල නිලධාරියා වෙනුවෙන් රක්ෂණ ආවරණය ලබා දීමට අදාල සමීපතම අධීක්ෂණ නිලධාරියා කටයුතු කළ යුතු ය.

9.3.4 වන්දි ඉල්ලීමේ අයදුම් පත්‍රය හා අනෙකුත් ලියවිලි දින 30 ක් තුළ ප්රධාන කාර්යාලයට ඉදිරිපත් කළ යුතු ය.

9.4 මෙම සියලුම වන්දි ඉල්ලීම්වලදී පරීක්ෂණ නිලධාරීන් හෝ ප්‍රධාන කාර්යාලයෙන් හෝ ඉල්ලා සිටින ඕනෑම ලියවිල්ලක් ලබාදීමට අදාල නිලධාරීන් කටයුතු කළ යුතු ය

10. රක්ෂණ වන්දි මුදල් ගෙවීම.

10.1 අතුරුදී මුදල් රක්ෂණ වන්දි ගෙවීම.

10.1.1 අදාල පරීක්ෂණ වාර්තා සැලකිල්ලට ගෙන විගණන අංශයේ නිලධාරී වාර්තා ද පදනම් කරගනිමින් අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය මත වන්දි මුදල් ගෙවනු ලැබේ.

10.1.2 නැති වූ මුළු මුදල ම සොයා ගත හොත් වන්දි ගෙවනු නො ලැබේ. ඉන් කොටසක් සොයා ගතහොත් සොයාගත් ප්‍රමාණය හැර ඉතිරි මුදල වන්දි ලෙස ගෙවනු ලැබේ.

10.1.3 වන්දි ගෙවීමෙන් පසු යම් මුදල් ප්‍රමාණයක් සොයාගත හොත් එම සොයාගත් මුදල් ප්‍රමාණය නැවත අතුරුදී මුදල් රක්ෂණ අරමුදලට ලබාදිය යුතු ය.

10.1.4 අනවශ්‍ය පරිදි විශාල මුදල් ප්‍රමාණයක් සඳහා රක්ෂණ ආවරණය ලබාගෙන විශාල මුදලක් සේප්පුවේ තබාගෙන හෝ ප්‍රවාහනය කරමින් හෝ සිටින අවස්ථාවක යම් සිදුවීමක් වුවහොත් වන්දි ගෙවීමේදී ඒ පිළිබඳව අවධානය යොමු කරනු ඇත. එහිදී අනවශ්‍ය පරිදි ඉහළ මුදල් ප්‍රමාණයක් සඳහා රක්ෂණ ආවරණය ලබාගෙන ඇති බව අනාවරණය වුවහොත් එවැනි නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කරනු ලැබේ.

10.1.5 මුදල් සොරාගැනීමක්, පැහැරගැනීමක් සඳහා යම් නිලධාරියකු සම්බන්ධ වුවහොත් හෝ වංචනික ක්‍රියාවක් සිදු කර තිබුණහොත් හෝ එවැනි අවස්ථාවක අතුරුදී මුදල් රක්ෂණ අරමුදලින් වන්දි ගෙවනු නො ලැබේ. එවැනි අවස්ථාවක පරීක්ෂණයක් සිදුකර අදාල නිලධාරීන්ට විනයානුකූලව කටයුතු කරනු ඇත.

10.1.6 චක්‍රලේඛ උපදෙස් නො තකා කටයුතු කිරීම හේතුවෙන් මුදලේ ආරක්ෂාව බිඳවැටී මුදලට කිසියම් හානියක් සිදු වුවහොත්, පරීක්ෂණ මගින් එම කරුණු තහවුරු වූ විට කළමනාකරු ඇතුළු කාර්ය මණ්ඩලය තම පෞද්ගලික මුදලින් ඒ සඳහා වන්දි ගෙවිය යුතු ය.

10.1.7 මුදල් පැහැරගැනීමක්, සොරාගැනීමක් සිදුවූ අවස්ථාවක ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති කාර්ය මණ්ඩලය සතු පෞද්ගලික මුදල්, රන් භාණ්ඩ, දුරකථන යනාදී වටිනා දේපලවලට හානියක් සිදුවූව ද ඒ සඳහා අතුරුදී මුදල් රක්ෂණ අරමුදලින් වන්දි ගෙවනු නො ලැබේ.

10.1.8 ක්ෂේත්‍රයේ කටයුතු කරන සමෘද්ධි සංවර්ධන නිලධාරීන් භාරයේ පැවති ප්‍රජාව සතු මුදල් සොරාගැනීමක්, පැහැරගැනීමක් වෙනුවෙන් අතුරුදී මුදල් රක්ෂණ වන්දි ගෙවීමේදී ඔවුන් චක්‍රලේඛ උපදෙස් නිසි පරිදි අනුගමනය කර තිබේදැයි විශේෂයෙන් පරීක්ෂා කරනු ලැබේ. චක්‍රලේඛ උපදෙස් උල්ලංඝනය කර තිබේ නම් වන්දි ගෙවනු නො ලැබේ.

10.1.9 එවන් සිදුවීමක දී ක්ෂේත්‍රයේ කටයුතු කරන සංවර්ධන නිලධාරීන් යම් වංචනික ක්‍රියාවක් සිදු කර ඇති බව තහවුරු වුවහොත් ඔවුන්ට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ලැබේ.

10.1.10 ක්ෂේත්‍රයේ කටයුතු කරන සංවර්ධන නිලධාරීන් භාරයේ පැවති ප්‍රජාව සතු මුදල් සොරාගැනීමක්, පැහැරගැනීමක් සිදුවන අවස්ථාවක ඔවුන්ගේ පෞද්ගලික මුදල් ඇතුළු වෙනත් වටිනා දේපල සොරාගැනීමක් හෝ ඒවාට යම් හානියක් සිදුවූවහොත්, ඒ සඳහා වන්දි ගෙවනු නො ලැබේ.

10.2 මුදල් සේප්පුව සඳහා වන්දි ගෙවීම.

10.2.1 සමෘද්ධි ප්‍රජාමූල බැංකු, ප්‍රජාමූල බැංකු සමිති සතු මුදල් සොරාගැනීමක්, පැහැරගැනීමක් හෝ එවන් ක්‍රියාවකට තැත් කිරීමක් හේතුවෙන් හෝ මුදල් සෙප්පුව සම්පූර්ණයෙන් විනාශ වුවහොත් හෝ පැහැරගෙන ගියහොත් සිදුවූ අලාභය සඳහා අදාල වාර්තා සැලකිල්ලට ගෙන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය මත වන්දි ගෙවනු ලැබේ.

10.2.2 සේප්පුව සඳහා වන්දි ගෙවන විට මුදල් සොරාගැනීමක්, පැහැරගැනීමක් හෝ එවන් ක්‍රියවකට තැත් කිරීමක් හෝ පිළිබඳ වාර්තා වී තිබිය යුතු ය. එසේ නොමැති අවස්ථාවල වන්දි මුදල් ගෙවනු නො ලැබේ.

10.3 ශාරීරික අනතුරු සඳහා රක්ෂණ වන්දි ගෙවීම.

10.3.1 සමෘද්ධි ප්‍රජාමූල බැංකු සතු මුදල් සොරාගැනිමක්, පැහැරගැනීමක් හෝ එවැනි ක්‍රියාවට තැත් කිරීමකදී හෝ නිලධාරීන්ට සිදුවන ජීවිත හානි, ශාරීරික හානි වෙනුවෙන් අදාල වාර්තා පදනම් කර ගනිමින් අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියෙන් වන්දි ගෙවනු ලැබේ.

10.3.2 මේ සඳහා ගෙවනු ලබන උපරිම වන්දි මුදල රු.ලක්ෂ 3 කි.

10.3.3 කොවිඩ් හා හදිසි අනතුරු රක්ෂණය සඳහා 2021/12 චක්‍රලේඛය අනුව ගෙවීම් කරනු ලැබේ.

10.3.4 මෙම රක්ෂණ ප්‍රතිලාභයට හිමිකම් ලැබීම සඳහා අතරැදි මුදල් රක්ෂණය යටතේ බැංකුවේ මුදල් සඳහා ආරක්ෂාව සම්බන්ධයෙන් අනුගමනය කලයුතු සියලු ම ක්‍රියාමාර්ග ගෙන තිබීමද අත්‍යාවශ්‍ය වේ.

10.3.5 සිද්ධිය වී මසක් ඇතුළත ආපදාවන්ට භාජනය වන සේවකයන්ට හානියේ ස්වාභාවය අනුව පහත සඳහන් අන්දමට වන්දි මුදල් ගෙවනු ලැබේ.

සිදුවීම/ හානියේ ස්වාභාවය (මුදල් සොරාගැනීමක්/ පැහැර ගැනීමක් සිදුවූ අවස්ථාවක පමණි)	හිමිවන වන්දි මුදල (රු.)
i. මරණය	300,000.00
ii. දෑසේ පෙනීම මුළුමනින්ම ජීවිතකාලයටම අහිමි වීම	300,000.00
iii. ශාරීරිකව වෙන් වීමෙන් දෑත ම හෝ දෙපය ම හෝ එක් අතක් සමග එක් පාදයක් හෝ මුළුමනින් ම අහිමි වීම	300,000.00
iv. එක් ඇසක පෙනීම මුළුමනින් ම ජීවිතකාලයට ම නැතිවීම සමග ශාරීරිකව වෙන්වීමෙන් එක් අතක් හෝ එක් පාදයක් හෝ මුළුමනින් ම අහිමිවීම	300,000.00
v. එක් ඇසක පෙනීම මුළුමනින් ම ජීවිතකාලයටම අහිමි වීම	150,000.00
vi. ශාරීරිකව වෙන්වීමෙන් එක් අතක් හෝ එක් පාදයක් මුළුමනින් ම අහිමි වීම.	150,000.00
vii. ස්ථිර සහ පූර්ණ අකර්මන්‍යතාවය සඳහා රජයේ රෝහලකින් ලබාදෙන නිර්දේශය මත	300,000.00
viii. රජයේ, පෞද්ගලික හෝ පිළිගත් ආයුර්වේද රෝහලක නේවසිකව ප්‍රතිකාර ලැබීම වෙනුවෙන්	දිනකට රු.1000.00 උපරිම සති දෙකක කාලයක් සඳහා.
ix. වෛද්‍ය නිර්දේශය මත රාජකාරියේ නියැලීමට නොහැකිව නිවාඩු ලබාසිටින කාලය සඳහා	දිනකට රු.500.00 උපරිම සති දෙකක කාලයක් සඳහා.
x. මෙයට අමතරව උද්ගත වන ශාරීරික හා මානසික යම් දුබලතාවයක් වෙනුවෙන් වෛද්‍ය නිර්දේශ මත	අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය යටතේ ගෙවීම් සඳහා සලකා බලනු ඇත.

10.3.6 ජීවිත හානියකදී විවාහක නම් කලත්‍රයාට හා දරුවන්ටත්, අවිවාහක නම් දෙමාපියන්ටත්, දෙමාපියන් නොමැති නම් සහෝදරයන්ටත් මෙම වන්දි මුදල් ගෙවනු ලැබේ.

10.3.7 ශාරීරික අනතුරු සඳහා වන්දි ඉල්ලුම් කිරීමේ දී නිලධාරියා ද මරණයකදී නිලධාරියා වෙනුවෙන් වන්දි ඉල්ලුම්කරන නීත්‍යානුකූල ඥාතියා ද වන්දි ඉල්ලීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

10.3.8 සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඕනෑම ස්ථිර සේවයෙකු රාජකාරි කටයුත්තක් සඳහා බැංකු පරිශ්‍රය තුළ රැඳී සිටියදි සිදුවන සොරකමකදි හෝ මංකොල්ලකෑමකදි, එසේ කිරිමට තැත් කිරීමකදි ශාරීරිකව යම් ආපදාවකට භාජනය වුවහොත් එම නිළධාරියාද මෙම රක්ෂණ ප්‍රතිලාභ සඳහා හිමිකම් ලබයි.

11. ගිණුම් සටහන් තැබීම.

11.1. සමෘද්ධි ප්‍රජාමූල බැංකු සඳහා ගිණුම් සටහන්.

(i) සමෘද්ධි ප්‍රජාමූල බැංකු අතරැඳි මුදල්, මුදල් සේප්පු, ශාරීරික අනතුරු රක්ෂණය හා කොවිඩ් හා හදිසි අනතරු රක්ෂණය වෙනුවෙන් චෙක්පත් එවීමේදී තැබිය යුතු ගිණුම් සටහන්.

2108 - වැය ගිණුම අතරැඳි මුදල් හා මුදල් සේප්පුව සඳහා රක්ෂණ ගාස්තු - හර
2107 - වැය ගිණුම ශාරීරික අනතුරු සඳහා රක්ෂණ ගාස්තු - හර
3001 - ජංගම ගිණුම - බැර

(ii) 10% ප්‍රමාද ගාස්තු බැංකු කාර්ය මණ්ඩලයෙන් අය කරගන්නා විට ගිණුම් සටහන් තැබීම.

(iii) ප්‍රමාද ගාස්තු නිලධාරින්ගේ මුදලින් අය කරගැනීම

3401 - අත ඉතිරි මුදල් ගිණුම - හර

4048 - රක්ෂණ ගාස්තු ප්‍රමාද කිරීම හේතුවෙන් කාර්ය මණ්ඩලයෙන් අය කරගත් අධිභාර රැස් කරනු ලබන ගිණුම - බැර

(iv) ප්‍රමාද ගාස්තු නිලධාරින්ගේ තැන්පත් ගිණුමෙන් අය කරගැනිම

4407 / 4403 - අදාල තැන්පත් ගිණුම (සාමාජික නොවන තැන්පතු / දිරියමාතා) - හර

4048 - රක්ෂණ ගාස්තු ප්‍රමාද කිරීම හේතුවෙන් කාර්ය මණ්ඩලයෙන් අය කරගත් අධිභාර රැස් කරනු ලබන ගිණුම - බැර

(v) ප්‍රමාද ගාස්තු සමඟ රක්ෂණ වාරික මුදල් ක්ෂුද්‍රමූල්‍ය අංශයට එවීම.

2108 - වැය ගිණුම අතරැඳි මුදල් හා මුදල් සේප්පුව සඳහා රක්ෂණ ගාස්තු - හර
2107 - වැය ගිණුම ශාරීරික අනතුරු සඳහා සඳහා රක්ෂණ ගාස්තු - හර
4048 - රක්ෂණ ගාස්තු ප්‍රමාද කිරීම හේතුවෙන් කාර්ය මණ්ඩලයෙන් අය කරගත් අධිභාර රැස් කරනු ලබන ගිණුම - හර
3001 - ජංගම ගිණුම - බැර

(vi) මුදල් සොරා ගැනීමක්, මංකොල්ලකෑමක් සිදු වූ විට ගිණුම් තැබීම.

3310 - අවිනිශ්චිත ගිණුම (ණයගැතියෝ) - හර
3401 - අත ඉතිරි මුදල් ගිණුම - බැර

(vii). මුදල් සොරා ගැනිමක් වෙනුවෙන් වන්දි මුදල් සඳහා වූ චෙක්පත බැංකුගත කිරීම.

3001 - ජංගම ගිණුම - හර
4003 - ගණුදෙනු කරුවන් තැන්පත් කළ චෙක්පත් ගිණුම - බැර

(viii). බැංකු ගත කළ චෙක්පත උපලබ්ධි වීම සහ හානිය කපාහැරීම.

4003 - ගණුදෙනු කරුවන් තැන්පත් කළ චෙක්පත් ගිණුම - හර
3310 - අවිනිශ්චිත ගිණුම (ණයගැතියෝ) - බැර

(ix). ක්ෂේත්‍ර නිළධාරීන් භාරයේ පැවති මුදල් සොරාගැනීමක් පැහැර ගැනීමක් සිදුවූ විට ගිණුම් සටහන් තැබීම.

3309 සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට ප්‍රතිපූර්ණය කළයුතු අරමුදල් ගිණුම - හර

දිරියමාතා/ සාමාජික .... තැන්පතු ගිණුම - බැර

ඒ අනුව එක් එක් පුද්ගලික ඉතුරුම් ගිණුම්වල ද සටහන් කල යුතු ය. පරිගණක මෘදුකාංගය හරහා පුද්ගලික ගිණුම්වල ස්වයංක්‍රීයව සටහන් වේ.

(x). වන්දි මුදල් ලද විට ගිණුම් සටහන් තැබීම.

3001- ජංගම ගිණුම - හර
3309 සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට ප්‍රතිපූර්ණය කළයුතු අරමුදල් ගිණුම - බැර

11.2 ප්‍රජාමූල බැංකු සමිති සඳහා ගිණුම් සටහන්

(i). ප්‍රජාමූල බැංකු සමිති අතරුදී මුදල්, මුදල් සේප්පු හා ශාරීරික අනතුරු රක්ෂණය (කොවිඩ් හා හදිසි අනතුරු) වෙනුවෙන් චෙක්පත් එවීමේදී තැබිය යුතු ගිණුම් සටහන්

6403 - වැය ගිණුම අතරුදී මුදල් හා මුදල් සේප්පුව සඳහා රක්ෂණ ගාස්තු - හර
6404 - වැය ගිණුම ප්‍රජාමූල බැංකු සමිති කාර්ය මණ්ඩලය සඳහා ශාරීරික අනතුරු රක්ෂණ ගාස්තු එවීම. - හර
7002 - ජංගම ගිණුම - බැර

(ii). 10% ප්‍රමාද ගාස්තු සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති කාර්ය මණ්ඩලයේ පෞද්ගලික මුදලින් අය කර ගන්නා විට ගිණුම් සටහන් තැබීම.

7001 - අත ඉතිරි මුදල් ගිණුම - හර

9426- රක්ෂණ ගාස්තු ප්‍රමාද කිරීම හේතුවෙන් කාර්ය මණ්ඩලයෙන් අය කරගත් අධිභාර රැස් කරනු ලබන ගිණුම - බැර

(iii). ප්‍රමාද ගාස්තු නිලධාරීන්ගේ තැන්පත් ගිණුමෙන් අය කර ගැනීම.

9001 - සමෘද්ධි ශ්‍රම ශක්ති ඉතිරි කිරීමේ ගිණුම - හර
9426 - රක්ෂණ ගාස්තු ප්‍රමාද කිරීම හේතුවෙන් කාර්ය මණ්ඩලයෙන් අය කරගත් අධිභාර රැස් කරනු ලබන ගිණුම - බැර

(iv). ප්‍රමාද ගාස්තු සමග රක්ෂණ වාරික මුදල් ක්ෂුද්‍ර මූල්‍ය අංශයට එවීමේදී තැබිය යුතු ගිණුම් සටහන්. (ප්‍රජාමූල බැංකු සමිතිය)

6403 අතරුදී මුදල් හා මුදල් සේප්පුව සඳහා රක්ෂණ ගාස්තු - හර
6404 - ප්‍රජාමූල බැංකු සමිති කාර්ය මණ්ඩලය සඳහා ශාරීරික අනතුරු රක්ෂණ ගාස්තු එවීම. - හර
9426 - රක්ෂණ ගාස්තු ප්‍රමාද කිරීම හේතුවෙන් කාර්ය මණ්ඩලයෙන් අය කරගත් අධිභාර රැස් කරනු ලබන ගිණුම - හර
7002 - ජංගම ගිණුම - බැර

(v). ප්‍රජාමූල බැංකු සමිති සතු මුදල් සොරාගැනීමක් මංකොල්ලකෑමක් සිදුවූ විට ගිණුම් තැබිම.

7501 අවිනිශ්චිත ගිණුම ණය ගැතියෝ - හර
7001 - අත ඉතිරි මුදල් ගිණුම - බැර

(vi). මුදල් සොරාගැනීමක් වෙනුවෙන් වන්දි මුදල් සඳහා වූ චෙක්පත බැංකුගත කිරීම.

7002 - ජංගම ගිණුම - හර
9304 - ගණුදෙනුකරුවන් තැන්පත් කළ චෙක්පත් ගිණුම - බැර

(vii). බැංකු ගත කළ චෙක්පත උපලබ්ධිවීම සහ හානිය කපාහැරීම.

9304 ගණුදෙනුකරුවන් තැන්පත් කළ චෙක්පත් ගිණුම - හර
7501 අවිනිශ්චිත ගිණුම ණය ගැතියෝ - බැර

11.3. සමාද්ධි ප්‍රජාමූල බැංකුවල අතරැදි මුදල් හා ශාරීරික අනතුරු රක්ෂණ වාරික එවීම සඳහා හඳුන්වා දී තිබූ 2108 - සොරකම් මංකොල්ලකෑම් සඳහා රක්ෂණ ගාස්තු නම් ගිණුම අතරැදි මුදල් හා මුදල් සේප්පුව සඳහා රක්ෂණ ගාස්තු ගිණුම ලෙස සංශෝධනය කර ඇත.

11.4. සමෘද්ධි ප්‍රජාමූල බැංකුවල ශාරීරික අනතුරු රක්ෂණ වාරික එවීම සඳහා හඳුන්වා දී තිබූ 2107 - සංසරණය වන මුදල් ගාස්තු සඳහා රක්ෂණ ගාස්තු නම් ගිණුම ශාරීරික අනතුරු සඳහා සඳහා රක්ෂණ ගාස්තු ගිණුම ලෙස සංශෝධනය කර ඇත.

11.5. නිලධාරීන්ගෙන් ප්‍රමාද ගාස්තු අය කර ගැනීම සඳහා හඳුන්වාදී තිබූ 4048 - දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්ෂුද්‍ර මූල්‍ය අංශයට යැවිය යුතු නිලධාරීන්ගෙන් අය කර ගත් ප්‍රමාද ගාස්තු ගිණුම, රක්ෂණ ගාස්තු ප්‍රමාද කිරීම හේතුවෙන් කාර්ය මණ්ඩලයෙන් අය කරගත් අධිභාර ගිණුම ලෙස සංශෝධනය කර ඇත.

11.6. ප්‍රජාමූල බැංකු සමිතිවල අතරැදි මුදල් රක්ෂණය එවීම සඳහා හඳුන්වා දී තිබූ 6403 - සංසරණය වන මුදල් සඳහා සංරක්ෂණ ගාස්තු නම් ගිණුම අතරැදි මුදල් හා මුදල් සේප්පුව සඳහා රක්ෂණ ගාස්තු ලෙස සංශෝධනය කර ඇත.

11.7. ප්‍රජාමූල බැංකු සමිතිවල නිලධාරීන්ගෙන් අය කර ගත් ප්‍රමාද ගාස්තු එවීම සඳහා රක්ෂණ ගාස්තු ප්‍රමාද කිරීම හේතුවෙන් කාර්ය මණ්ඩලයෙන් අය කරගත් අධිභාර ගිණුම හඳුන්වා දී ඇත. (කේත අංක 9426)

12. වට්ටම් දීමනාවක් ලබාදීම.

12.1 අතරැදි මුදල් හා ශාරීරික අනතුරු රක්ෂණ වැඩසටහන මගින් 2022 වසර සඳහා සමෘද්ධි ප්‍රජාමූල බැංකු වෙත වට්ටම් දීමනාවක් ලබාදේ. මෙය දැනට 2022 වසරට පමණක් අදාළ වන පරිදි ලබා දේ.

12.2 ආසන්න වසර 10 ක කාලය තුළ අතරැදි මුදල් රක්ෂණ අරමුදලින් වන්දි ලබාගෙන නොමැති සහ සොර සතුරු උපද්‍රවයන්ට ලක්වීමක් පිළිබඳ වාර්තා වී නොමැති සමෘද්ධි ප්‍රජාමූල බැංකු සඳහා 2022 වසර වෙනුවෙන් අමතර 5% ක වට්ටමක් හිමි වේ.

12.3 සාමාන්‍ය පරිදි වාර්ෂිකව වාරික එවීමේ දී 5% ක සහනය ලබාදෙන මුදල් සීමාවේ සිටින බැංකු විසින් 5% ක සහන මුදල අඩු කළ පසු ලැබෙන මුදලින් මෙම විශේෂිත වට්ටම් ලෙස ලබාදෙන 5% ක මුදල අඩු කළ යුතුය. එවිට එම බැංකු සඳහා වාර්ෂිකව 10% ක සහනයක් හිමි වේ.

සාමාන්‍ය පරිදි වාරික එවීමේ දී 5% ක සහනය හිමි නොවන මුදල් සීමාවේ සිටින බැංකු සඳහා 5% ක විශේෂ වට්ටම හිමි වේ.

උදා :- 2022 වසර සඳහා රු.500.000/- ක් සඳහා එවිය යුතු රක්ෂණ වාරික මුදල රු.12,000/- යි.

5% යේ සහනය ලබාගත් විට එවිය යුතු මුදල රු. $\frac{12,000 \times 5}{100}$ = රු. 600

රු. 12,000 - 600 = **රු.11,400**

පසුගිය අවුරුදු 10 තුළ සොරසතුරු උපද්‍රවවලට ලක් නොවීම හේතුවෙන් ලබාදෙන විශේෂිත වට්ටම අඩු කල පසු එවිය යුතු මුදල වනුයේ.

$\frac{11,400 \times 5}{100}$ = රු. 570

රු. 11,400 - 570 = **රු.10,830**

උදා :- 5% ක සහනය නොලැබෙන රු. මිලියන 05 මුදල් සීමාව සඳහා 5% ක වට්ටම අඩුකල පසු එවිය යුතු මුදල

රු. $\frac{72,000 \times 5}{100}$ = රු. 3,600

රු. 72,000 - 3,600 = **රු.68,400**

12.3 විශේෂ ප්‍රසාද දීමනාව සඳහා හිමිකම් ලබන බැංකු 12.2 සඳහන් කරුණු සනාථ කිරීම සඳහා ඇමුණුම 05 සම්පූර්ණ කර අනුමත කර ගැනීමෙන් පසු වාරික මුදලින් 5% ක ප්‍රමාණය අඩු කර රක්ෂණ වාරිකය සඳහා චෙක්පත ලිවිය යුතු ය.

12.4 වංචනික ලෙස මෙම සහනය ලබා නො ගත යුතු ය. එවැන්නක් පිළිබඳ අනාවරණය වුවහොත් අඩු කළ 5% ක මුදල නැවත ගෙවිය යුතු ය. එසේම අදාල නිලධාරීන්ට විනයානුකූලව කටයුතු කරනු ලැබේ.

13. පොදු කරුණු

13.1 සමෘද්ධි ප්‍රජාමූල බැංකු, ප්‍රජාමූල බැංකු සමිති, අතරැදි මුදල් සීමාව තීරණය කිරීම සේප්පුවේ මුදල් තැන්පත් කිරීම වාණිජ බැංකු වෙත මුදල් රැගෙන යාම හා රැගෙන ඒම වැනි කටයුතුවලදී අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කර ඇති අනෙකුත් චක්‍රලේඛ මගින් ලබා දී ඇති උපදෙස් ද ඒ අයුරින්ම අනුගමනය කළ යුතු ය.

13.2 ක්ෂේත්‍රයේ කටයුතු කරන සංවර්ධන නිළධාරීන් ද ඔවුන්ට ලබා දී ඇති චක්‍රලේඛ උපදෙස් සියල්ල ඒ අයුරින්ම අනුගමනය කළ යුතු ය. ක්ෂේත්‍ර නිළධාරීන් බැංකු වෙත මුදල් භාරදීම සඳහා ගිවිසුම්ගත වී තිබීම අනිවාර්ය වේ.

13.3 රක්ෂණ ආවරණය ලබා දී තිබුණද ප්‍රජාවගේ මුදලට හා තමාට වන හානිය සහ අනතුරු අවම වන ආකාරයට කටයුතු කිරීමට සියලුම නිලධාරීන් වග බලා ගත යුතු ය.

ආර්.පී.බී. තිලකසිරි,
අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත් :-

1. ලේකම්, සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය - කා.දැ.ස.
2. දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල්වරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය.- කා.දැ.ස.
3. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - දැ.ස. හා අ.ක.ස.
4. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.ස.
5. ප්‍රධාන ගණකාධිකාරි, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.ස.
6. සියලුම අංශ ප්‍රධානීන්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.ස.
7. ප්‍රාදේශීය ලේකම්වරුන්,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. - කා.දැ.ස.
8. නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්/ සහකාර අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - දැ.ගැ.ස හා අ.ක.ස.